
අක්කාගේ
ඉනුලී තෙභාෂ්නා
වික්‍රමසිංහ

# අක්කා නගෝ

ඉනුලි තෙහස්නා වික්‍රමසිංහ

# අක්කා නගෝ

ඉනුලි තෙහස්නා වික්‍රමසිංහ

**<u>කතෘගේ වෙනත් කෘති</u>**

එකමුතු මිතුරෝ (2023)

ISBN-978-624-208-243-1

# පිදුම

මට නැණ මිහිර ලබා දෙන

ආදරණීය මහමායා පාසල් මෑණියන්ට....

මට අකුරු ලියන්න කියවන්න කියා දෙන

සිසිරා වන්ද්‍රලතා ගුරු මෑණියන්ට...

ගයත්‍රි සෙනෙවිරත්න ගුරු මෑණියන්ට...

මගේ ම ආදරණීය අම්මාට, අප්පව්වීට

ආදර ගෞරවයෙන්

පිළිගන්වමි..!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් සවර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනඟන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වන නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

“සඳිති, පිනිති.... මේ බලන්න..

කවු ද ඇවිල්ලා ඉන්නේ කියලා”

අම්මා කතා කළා.

“අදත් මේ අක්කා නගෝ දෙන්නා තරහා වෙලාවත් ද?

පේන්න නැත්තේ”

අත්තම්මා අම්මාගෙන් ඇහුවා.

අත්තම්මාගෙයි, අම්මාගෙයි කටහඬ ඇහිලා අක්කා

නගෝ දෙන්නා දුවගෙන ආවා.



පිනිති ඉක්මනට දුවලා ගිහින් අත්තාම්මා ව බදා ගත්තා.

“හු…! හු…! අක්කා අත්තම්මාට ආදරේ නෑ…

මම තමා අත්තම්මාට ආදරේ…

හු…! හූ…!”

පිනිති අක්කාට විහිළු කළා.

“හරි හරි…

මම මගේ දුවලා දෙන්නාට ම ආදරෙයි”

අත්තම්මා අක්කා නගෝ දෙන්නා ව තුරුළු කර ගත්තා.



“හරි, හරි

දැන් දෙන්නා  ම යන්න ගිහින් සෙල්ලම් කරන්න..

මම අත්තම්මාට තේ හදලා දෙන්න ඕන...

හොඳ ළමයි දෙන්නා වගේ සෙල්ලම් කරලා

ඉස්කෝලේ වැඩ ඉවර කරන්න...”

අම්මා කිව්වා.

“හුරේ..! හුරේ..!

අපි දෙන්නා සෙල්ලම් කරමු අක්කේ..

අපි ඉස්කෝලයක් දාමු... හැබැයි මම තමයි ටීචර්

වෙන්නේ...”

පිනිති කිව්වා.

“නෑ... නෑ... නංගී මමනේ ලොකු.. මම ටීචර් වෙන්නේ”

සඳිති කිව්වා.

“නෑ... මම.....”

“නෑ මම....”

දෙන්නා රණ්ඩු කළා.



ඉතින් වෙනදා වගේ  ම අක්කා නගෝ දෙන්නාගේ

සෙල්ලම ඉවර වුණේ පුංචි රණ්ඩුවකින්..

අප්පච්චි ගෙදර ආවා.

අප්පච්චි එදා මේ රණ්ඩුව බේරුවා.

"හොඳ ළමයි දෙන්නා වගේ දෙන්න  ම ඇඟ සෝදගෙන එන්න.." අම්මා කිව්වා.

"ඔන්න අද රෑට මම තමයි අත්තම්මා ළඟ නිදා ගන්නේ"

පිනිති කිව්වා.

ඉතින් එදා මේ අක්කා නගෝ දෙන්නා ම අත්තම්මා ළඟ නිදා ගත්තා. අත්තම්මා අක්කා  නගෝ දෙන්නාට නින්ද යනකම්  ලස්සන කතන්දර කිව්වා.



උදේ වුණා. අම්මයි තාත්තයි උදෙන් ම නැගිටලා දුර ගමනක් යන්න ලෑස්ති වුණා.

“ෂා...! අද අම්මා හරිම ලස්සනයි...

අම්මයි අප්පච්චියි කොහේ හරි යන්න ද?” සඳිති ඇහුවා.

“අපිව අරන් යන්නේ නැද්ද අම්මේ...?”පිනිති ඇහුවා.

“බෑ.. බෑ... පුතේ අපි ගම්පහ ලොකු මාමලාගේ ගෙදර යන්නේ...

මගේ දූවලා දෙන්නා පරිස්සමෙන් ඉන්න...

දෙන්නා රණ්ඩු කරන්නේ එහෙම නෑ...

අත්තම්මාට කරදර කරන්න එපා...

හොඳ ළමයි දෙන්නා වගේ අත්තම්මා කියන දේ අහලා ඉන්න ඕන....”

අම්මා අවවාද කළා.

“හරි අම්මේ.... අපි අම්මා කියපු විදිහට ඉන්නම්...”

සදිති කිව්වා.

අම්මයි අප්පච්චියි ගියා.



අක්කයි නංගියි දෙන්නා අත්තම්මා එක්ක රූපවාහිනිය නැරඹුවා.

"මම කාලෙකින් මගේ නංගිගේ ගෙදර ගියේ නෑ...
මම ඒ පැත්තේ ගිහින් එන්නම්..."
අත්තම්මා එහෙම කියලා චූටි ආච්චිගේ ගෙදර ගියා.

ටික වෙලාවකින් අක්කාටයි, නංගිටයි ඇහුණා අත්තම්මා කතා කරනවා.
දෙන්න ම ඇයි බලන්න දුවගෙන ගියා.
"අනේ....! බලන්නකෝ අත්තම්මා වැටිලා..."



“අක්කේ... අත්තම්මාගේ ඔළුව ගෙඩි ගැහිලා...

දණහිසෙන් ලේත් ගලනවා...” පිනිති කිව්වා.

“ඔව් නංගී... අපි අත්තම්මා ව පුටුවකින් වාඩි කරවමු...”

සඳිති කිව්වා.

දෙන්න ම කොහොම හරි අත්තම්මා ව පුටුවකින් වාඩි කෙරෙව්වා.

“නංගී.. අත්තම්මට බොන්න වතුර ටිකක් අරන් එන්න”

අක්කා කිව්වා.

නංගී ගිහින් වතුරයි, අයිස් කැටයි දෙක ම අරන් ආවා.

“අක්කේ... මට මතකයි අම්මා මගේ ඔළුව වැදුණාමත් අයිස් කැට තිබ්බා...” පිනිති කිව්වා.



“නංගී ඉක්මනට ගිහින් ගීතා නැන්දා ව එක්කන් එන්න...” සඳිති කිව්වා.

ගීතා නැන්දාවයි, ගාමිණී මාමාවයි දෙන්නාව ම නංගී එක්කම් ආවා.

එතකොටත් අක්කා අත්තම්මාගේ දණහිසට බෙහෙත් දානවා.

“ගොඩක් තුවාල වෙලා නෑ...

දුවලා දෙන්නා බය වෙන්න එපා..

ඔය දෙන්නා කරන්න ඕන දේවල් කරලනේ....”

ගාමිණී මාමා කිව්වා.

“හරිම හොඳ, දක්ෂ දුවලා දෙන්නෙක්...”

ගීතා නැන්දා කිව්වා.



“මගේ දුවලා දෙන්නා තමයි මේ ලොකේ ඉන්න

හොඳම අක්කා නගෝ දෙන්නා.......”

අත්තම්මා එහෙම කියලා,

අක්කා නගෝ දෙන්නා ව ආදරයෙන් තුරුළු කර ගත්තා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනඟා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.

ISBN-978-624-208-243-1